## මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ රියදුරු තනතුර සඳහා වන උසස් කිරීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : අදාල නොවේ

1.2 අමාත්‍යාංශය : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති
යොමු අංකය : MF1/1/09/පොදු/2022 දිනය : 2023.02.22

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම යොමු අංකය: DMS/CM/02 දිනය: 2020.09.04 හා 2022.10.17

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය යොමු අංකය : EST-2/04/REC/8535 දිනය : 2023.02.03

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය යොමු අංකය : NPC/01/02/SR දිනය : 2023.01.24

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය යොමු අංකය : PSC/EST/02-01-02/02/2023 දිනය : 2023.05.31 හා 2023.12.05

02. පත්කිරීමේ බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ප්‍රාථමික ශිල්පීය

3.2 ශ්‍රේණි : III, II, I සහ විශේෂ

3.3 පැවරෙන කාර්යය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයක් වෙත පැවරෙන කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙනයාම සඳහා වන මූලික අවශ්‍යතාවන් වන ඉදිකිරීම්, නඩත්තු, අලුත්වැඩියා, ආලෝකකරණය වැනි මූලික කාර්යයන් අතුරින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) හතර (04) වැනි මට්ටමේ කාර්මික පුහුණු සහතිකයක්/ප්‍රවීණතා සහතිකයක් මඟින් තහවුරු කෙරෙන කාර්මික/ශිල්පීය/වෘත්තීය කුසලතාවයන් අවශ්‍ය වන කාර්යයන් පවරනු ලබන තැනැත්තන්ගෙන් සහ ප්‍රවාහන කාර්යයන්හි අවශ්‍ය වන මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කෙරෙන මෝටර් රථ රියදුරු බලපත්‍රයක් දරන තැනැත්තන්ගෙන් සමන්විත සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත යෝග්‍යතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. (2016.01.01 දින හෝ ඊට පසු රාජ්‍ය සේවයට මුල් පත්වීම් ලද නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වනු ඇත.)

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : PL 3 - 2016

5.2 මාසික වැටුප් පරිමාණය : රු.25,790 – 10x270 – 10x300 – 10x330 –12x350- 38,990 /-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | 01 | 25,790/- |
| II | 12 | 28,790/- |
| I | 22 | 31,820/- |
| විශේෂ | 32 | 35,140/- |

06. සේවා ගණයට අයත් තනතුර/ තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව සහ එම තනතුරුවලට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| රියදුරු | III/ II/ I/ විශේෂ | 07 | ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : රියදුරු - 07

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I සහ විශේෂ ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

මෙම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වන සේ අනුමත කර ඇත. විශ්‍රාම යාම, ඉල්ලා අස්වීම හෝ වෙනත් හේතුවක් මත ඉවත් වීමෙන් තනතුර අහෝසි වේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ ස්වභාවය: ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව / වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03)ක් ගත වීමට පෙර | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය හා වාචික පරීක්ෂණය (ඇමුණුම 01) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස්වී වසර තුන (03) ක් ගතවීමට පෙර | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය (ඇමුණුම 02) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය (ඇමුණුම 03) |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද :

| | |
|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම<br>2 වන කාර්යක්ෂමතා කඩඉම<br>3 වන කාර්යක්ෂමතා කඩඉම | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් |

09. භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්යය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම
ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.
iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඩුවමක් ලබා නොතිබිය යුතුය.
v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.
vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන තිබීම.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධාන යන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09)ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව 1 ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3. I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.3.1.1. සපුරාලිය යුතු සුදුසුකම්

(i) සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09)ක් උපයා ගෙන තිබීම.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(iii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2. උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සංලක්ෂය : සාමාන්‍ය මට්ටමේ කාර්යසාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන : අදාළ නොවේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය - අදාළ නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරින්ට පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ සමත් වර්තමානයේ දෙපාර්තමේන්තුගත සේවයේ නියුතු නිලධාරින් කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කලා සේ සලනු ලැබේ.

18. අමාත්‍යාංශ නිර්දේශය :

සකස් කලේ :- අත්සන ..............................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එම්. එන්. එස්. පුෂ්ප කුමාර
තනතුර : පරිපාලන නිලධාරී
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.
දිනය : 2024/01/02

පරීක්ෂා කලේ :- අත්සන ..............................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එච්.ඒ.වී.කේ.පලන්සූරිය
සහකාර ලේකම්
මුදල් අමාත්‍යාංශය
තනතුර :
දිනය : 2024 . 01 . 06 කොළඹ - 01

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම :
තනතුර :
දිනය : 2024 . 01 . 11
නිල මුද්‍රාව
ඩී.එච්.එස්. පුල්ලපෙරුම
අතිරේක ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

---

යොමු අංකය : : MF1/1/09/පොදු/2022

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2023.05.31 දින හා 2023.12.05 දින අනුමත කරන ලද මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙහි ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ රියදුරු තනතුර සඳහා වන උසස් කිරිමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................

නම ..............................

ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දිනය : 17/01/2024

නිල මුද්‍රාව :
කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

19. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :

යොමු අංකය : PSC/EST/02-01-02/02/2023

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙහි ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ (PL-03) රියදුරු තනතුර සඳහා වන උසස්කිරීමේ පටිපාටිය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2023.05.31 දින හා 2023.12.05 අනුමත කරන ලදි.

අත්සන : ..............................................

නම : එච්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2024.05.07

නිල මුද්‍රාව : ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

ඇමුණුම - 01

01. විභාගයේ නම : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ රියදුරු තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාග පිළිබඳ විස්තර : නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයක් හා වාචික පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 50 | 20 |
| වාචික පරීක්ෂණය | 50 | 20 |
| එකතුව | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :

❖ නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

(i) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විධායක මට්ටමේ නිලධාරියෙකු සභාපති ලෙස
(ii) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයෙකු
(iii) පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු

❖ වාචික පරීක්ෂණය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

(i) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විධායක මට්ටමේ නිලධාරියෙකු සභාපති ලෙස
(ii) මෙම අමාත්‍යාංශයට පරිබාහිර දෙපාර්තමේන්තුවක විධායක මට්ටමේ නිලධාරියෙකු

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන්න : වසරකට දෙවරක්

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම |
| වාචික පරීක්ෂණය<br>1. ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම | පරිවාස කාලය, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ, අතිකාල දීමනා, නිවාඩු, දුම්රිය බලපත්‍ර, ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග, සාමාන්‍ය හැසිරීම හා විනය |
| 2. රජයේ වාහන පරිහරණය හා නඩත්තුව පිළිබඳ දැනුම | ➢ මෝටර් රථ රියදුරන්ගේ රාජකාරී සහ වගකීම<br>➢ රජයේ වාහන නඩත්තු කිරීම හා ආරක්ෂාව සම්බන්ධයෙන් රියදුරන්ගේ වගකීම<br>➢ දෛනික ධාවන සටහන් පොත<br>➢ වාහන ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම<br>➢ වාහන අළුත්වැඩියාව හා සේවා කටයුතු<br>➢ රජයේ වාහන වලට සිදුවන අනතුරු හා අනතුරු සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග |

සටහන : කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලදී සියලුම විෂයයන් එකවර සමත්විය යුතු යි.

| | | | |
|---|---|---|---|
| සකස් කළේ | :- ......................... | පරීක්ෂා කළේ | :- ......................... |
| නම | :- එම්. එන්. එස්. පුෂ්ප කුමාර | නම | :- එච්.ඒ.වී.කේ.පලන්සූරිය |
| තනතුර | :- පරිපාලන නිලධාරී | තනතුර | :- සහකාර ලේකම් |
| දිනය | :- මුදල් අමාත්‍යාංශය කොළඹ 01 2024/01/02 | දිනය | :- 2024.01.06 මුදල් අමාත්‍යාංශය කොළඹ - 01 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන.........................................
(ආයතන ප්‍රධානියා)

නම :- ඩී.එච්.එස්. පුල්ලපෙරුම
තනතුර :- අතිරේක ලේකම්
දිනය :- 2024.01.11
නිල මුද්‍රාව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ඇමුණුම - 02

01. විභාගයේ නම : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ රියදුරු තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාග පිළිබඳ විස්තර : නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය<br>1. මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | <br>50<br>50 | <br>20<br>20 |
| එකතුව | 100 | 40% |

03.විභාගය පවත්වනු ලබන බලධරයා : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

(i) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විධායක මට්ටමේ නිලධාරියෙකු සභාපති ලෙස

(ii) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයෙකු

(iii) පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන්න : වසරකට දෙවරක්

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ගතවූ සේවා කාලය තුළ සිදු වී ඇති පටිපාටිමය, නීතිමය වෙනස්වීම් හා නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජොෂ්ඨත්වයට ගැලපෙන පරිදි වර්ධනය වී ඇත්දැයි මැන බැලීම සිදු කෙරේ. |

සකස් කළේ :- ..........................
නම :- එම්. එන්. එස්. පුෂ්ප කුමාර
තනතුර :- පරිපාලන නිලධාරි
දිනය :- මුදල් අමාත්‍යාංශය
කොළඹ 01
2024/01/02

පරීක්ෂා කළේ :- ..............................
නම :- එච්.ඒ.වී.කේ.පලන්සූරිය
තනතුර :- සහකාර ලේකම්
දිනය :- 2024.01.06
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන..................................
(ආයතන ප්‍රධානියා)

නම :-
තනතුර :-
දිනය :-
නිල මුද්‍රාව

ඩී.එච්.එස්. පුල්ලපෙරුම
අතිරේක ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
2024.01.11

ඇමුණුම - 03

01. විභාගයේ නම : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ රියදුරු තනතුර සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාග පිළිබඳ විස්තර : නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | | |
| 1. මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 50 | 20 |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50 | 20 |
| එකතුව | 100 | 40% |

03.විභාගය පවත්වනු ලබන බලධරයා : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

(i) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විධායක මට්ටමේ නිලධාරියෙකු සභාපති ලෙස

(ii) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයෙකු

(iii)පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන්න : වසරකට දෙවරක්

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මහාමාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව දැනුමට අමතරව නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වයට ගැළපෙන පරිදි වර්ධනය වී ඇත්ද යන්න හා නිලධාරියා සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා ගෙන ඇත්ද යන්න මැන බැලීම සිදු කෙරේ. |

සකස් කළේ :- ..........................
නම :- එම්. එන්. එස්. පුෂ්ප කුමාර
තනතුර :- පරිපාලන නිලධාරී
දිනය :- මුදල් අමාත්‍යාංශය
කොළඹ 01 2024/01/02

පරීක්ෂා කළේ :- ..........................
නම :- එච්.ඒ.ඩී.කේ. පලන්සූරිය
තනතුර :- සහකාර ලේකම්
දිනය :- 2024.01.08
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන..........................
(ආයතන ප්‍රධානියා)

නම :- ඩී.එච්.එස්. පුල්ලෙපෙරුම
තනතුර :- අතිරේක ලේකම්
දිනය :- 2024.01.11
නිල මුද්‍රාව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

## ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය

**1. නිලධරයා පිළිබඳ තොරතුරු :**

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම :.............................................................................................

1.2 හැඳුනුම්පත් අංකය :.............................................................................................

1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය :.............................................................................................

1.4 අයත් වන සේවය හා තනතුර :.............................................................................................

1.5 අයත් වන සේවා ගණය හා ශ්‍රේණිය :.............................................................................................

**2. පත්වීම පිළිබඳ තොරතුරු**

2.1 පත්වීම් දිනය : .............................................................................................

2.2 පත්වීම ස්ථිර කළ දිනය : .............................................................................................

2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

**3. උසස් වීමට අදාළ තොරතුරු**

3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II/ I / විශේෂ

3.2 අවශ්‍ය සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කර තිබේ ද? ඔව්/ නැත

3.3 සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ...................................................................

3.4 අපේක්ෂිත සක්‍රීය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේ ද? : ඔව්/ නැත

3.5 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද ? ඔව්/ නැත

උසස් වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව්/ නැත

3.6 විනය දඬුවම් ලබා තිබේ ද? ඔව්/ නැත

3.7 සුවිශේෂී කාර්යසාධනය යටතේ වූ ලිඛිත විභාගය සමත් වූ දිනය : ........................................

3.8 විභාගයේ දී ලබා ගත් ලකුණු ප්‍රමාණය : ...................................................................

3.9 සුවිශේෂී කාර්යසාධනය යටතේ වූ ලිඛිත විභාගයට පෙනී සිටි වාර ගණන : ..........................

3.10 නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය සඳහා වූ අභියෝගතා පරීක්ෂණය සමත්වීමට නොහැකි වූයේ නම් ඊට හේතු : ..................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

**4.** අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත්.................................... දින සිට සාමාන්‍ය කාර්යසාධනය/ සුවිශේෂී කාර්යසාධනය යටතේ II / I / විශේෂ ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ..............................

.........................................
නිලධරයාගේ අත්සන